**සිංහල පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය ඇසුරිනි.**

(1) **පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම සොයා ලියන්න.**

වර්තමානයේ අපගේ ලෝකය පිළිබඳ දැනුම මීට වඩා බොහෝ ඉදිරියෙන් ඇත. අප ජීවත් වන පෘථිවිය පමණක් නො ව අනෙකුත් ග්‍රහලෝක ගැන ද බොහෝ තතු අපි දනිමු. පොතපත, අන්තර්ජාලය භාවිතයෙන් අපට ඒ තොරතුරු දැන ගැනීමට ද හැකි ය. ඒ දැනුම දිනෙන් දින අලුත් වන්නේ ලෝකය පිළිබඳ තවදුරටත් විමසා බලන මිනිසුන් නිසා ය.

(i) පෙරට වඩා දැනුම බොහෝ ඉදිරියෙන් ඇත්තේ කුමක් පිළිබඳව ද?

..........................................................................................................

(ii) අනෙකුත් ග්‍රහලෝක ගැන තතු අපට දැනගත හැක්කේ කෙසේ ද?

..........................................................................................................

(iii) ඡේදයේ සඳහන් සමාන පද යුගලයක් සොයා ලියන්න.

..........................................................................................................

(iv) පැරණි යන්නට විරුද්ධ පදය ඡේදයෙන් සොයා ලියන්න.

..........................................................................................................

(v) මහාප්‍රාණ අකුරක් සහිත වචනයක් ලියන්න.

..........................................................................................................

(vi) 'තතු' යන පදයේ අදහස ලියන්න.

..........................................................................................................

(2) **පහත කවිය කියවා පිළිතුරු සපයන්න.**



ඇසී නාද හඬ බඹරුගෙ ලීලා
පැසී ගොයම් පත් කිරට නැමීලා
ගැසී සුළං වාතෙට ඉති නැමිලා
පැසී ගොයම් කෙත සුරපුර ලීලා

(i) මෙම කවිය අයත්වන්නේ කුමන ජනකවි වර්ගයට ද?

..........................................................................................................

(ii) කෙත සමාන කර ඇත්තේ කුමකට ද?

..........................................................................................................

(iii) සඤ්ඤක අක්ෂර යෙදුණු වචන සොයා ලියන්න.

..........................................................................................................

(3) **පහත වචන සඳහා සුදුසු තනි පදය ඉදිරියෙන් ලියන්න.**

(i) කුඹුරක වැඩි ජලය බැස යාමට නියරෙහි කපන කපොල්ල - ........................

(ii) දිනපතා සිදු කරන - ....................................

(iii) කළ උපකාරය උසස් කොට සැලකීම - ......................................................

(4) **පහත යෙදුම්වල අදහස ලියන්න.**

(i) කට දානවා - ..........................................................................................

(ii) හොට දානවා - ..........................................................................................

(iii) වාං දානවා - ..........................................................................................

(5) **පහත කෘති රචනා කළේ කවුරුන්දැයි ඉදිරියෙන් ලියන්න.**

(i) සෙනසුරාංග අපල කළේ - ..................................................................

(ii) පඳුරු ගසා කිරි වැදිලා - ..................................................................

(iii) ප්‍රබන්ධෝපදේශය - ..................................................................

(iv) කිව්වම මොකද - ..................................................................

(6) **පහත වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.**

(i) ගස් සුළඟට පෙරළුණේ ය.

..........................................................................................................

(ii) ලේඛකයා නවකතා පොතක් ලිවුවා ය.

..........................................................................................................

(iii) නංගී කිරිල්ලියක්ට වතුර පොවයි.

..........................................................................................................

(iv) ජනතාව ජනාධිපති මන්දිරය වැටලුවේ ය.

..........................................................................................................

(v) තිසරි සහ මනුකි සහ අරිත හොඳ මිතුරියෝ ය.

..........................................................................................................

(vi) වෛද්‍යවරිය රෝග පරීක්ෂාවේ යෙදුණාහ.

..........................................................................................................

(vii) ඒවා පුස්තකාලවල තබා තිබුණාහ.

..........................................................................................................

(viii) සීයා ද මාමා ද වේදිකා නාට්‍ය නරඹයි.

..........................................................................................................

(ix) උදාරි ද මම ද පිරිසිදුව සිටිති.

..........................................................................................................

(x) අම්මාත් තාත්තාත් ගෙමිදුල සකස් කරයි.

..........................................................................................................

(7) **අසා ලියමු.**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ...................... | ________________ | (ii) | ...................... | ________________ |
| (iii) | ...................... | ________________ | (iv) | ...................... | ________________ |
| (v) | ...................... | ________________ | (vi) | ...................... | ________________ |
| (vii) | ...................... | ________________ | (viii) | ...................... | ________________ |
| (ix) | ...................... | ________________ | (x) | ...................... | ________________ |
| (xi) | ...................... | ________________ | (xii) | ...................... | ________________ |
| (xiii) | ...................... | ________________ | (xiv) | ...................... | ________________ |
| (xv) | ...................... | ________________ | (xvi) | ...................... | ________________ |
| (xvii) | ...................... | ________________ | (xviii) | ...................... | ________________ |
| (xix) | ...................... | ________________ | (xx) | ...................... | ________________ |

(8) **පහත වාක්‍යවල විරාම ලකුණු යොදන්න.**

(i) මේ ලිලී අම්මා හෙවත් වයලට් ආච්චි පාසලට පැමිණියේ අමුතු ම රාජකාරියකට ය

(ii) අර තනි කකුලෙ මේසයක් කවීෂා කීවා ය

(iii) නෙළුම් කවි ගොයම් කවි පතල් කවි පැල් කවි පාරු කවි ගැල් කවි ආදි වශයෙන් වර්ග කළ හැකිය

(iv) ලොකු අම්මා තාත්තාගේ ලොකු අයියාගේ බිරිඳ ඇගේ මේ අහිංසක සිහිනවල සිටි අපූරුත ම වීරවරියයි

(v) ඔහු මා අත දුර දක්නය තැබී ය



(9) **පහත සඳහන් මාතෘකා යටතේ නිවැරදි වැකි තුනක් ලියන්න.**

<u>**මම පුවත්පතක් වෙමි.**</u>

(i) ..........................................................................................................
..........................................................................................................

(ii) ..........................................................................................................
..........................................................................................................

(iii) ..........................................................................................................
..........................................................................................................

<u>**අපි වර්ධනය කර ගත යුතු හොඳ පුරුදු**</u>

(i) ..........................................................................................................
..........................................................................................................

(ii) ..........................................................................................................
..........................................................................................................

(iii) ..........................................................................................................
..........................................................................................................

(10) **පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් පුරවන්න.**

(i) ගඟට ........................... කැපුවා වගේ.

(ii) රයිගමයයි ............................. වගේ.

(iii) කට නිසා ඉබ්බා ...................... වගේ.



(11) **පහත තේරවිලි කවියට පිළිතුරු කවිය ලියන්න.**

සත් සමුදුරේ දිය පල්ලේ උපන් නේ
එම සමුදුරේ දිය මතුපිට පිපෙන් නේ
වැස්සට පිනි බබා නිතර ම මෝරන් නේ
අද බැරි නම් හෙට තෝරා එවන් නේ

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

(12) **පහත අදහස්වලට යෙදිය හැකි ඉඟිවැකිය ඉදිරියෙන් ලියන්න.**

(i) වගකීමෙන් බේරීම - ..........................................................

(ii) ඉටු නොවන සිහින මැවීම - ..........................................................

(iii) රවටනු පිණිස වර්ණනා කිරීම - ..........................................................

(iv) ඉතා ම කුඩා ප්‍රමාණයක් - ..........................................................

(13) **පහත ආප්තෝපදේශවල අදහස ලියන්න.**

(i) ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න.

..........................................................................................

(ii) ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න.

..........................................................................................

(iii) උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා.

..........................................................................................

(iv) අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න.

..........................................................................................

(14) **පහත වචන ගළපා අර්ථවත් වැකි නිර්මාණය කරන්න.**

(i) දවස්/ පහ ම/ පාසල්/ සිටිති/ අත්තම්මලා/ යන/ සතියේ

..........................................................................................

(ii) කීමට/ මම/ පෙර/ යමක්/ ඔල්සන්/ ආවා/ කාමරයට

..........................................................................................

(iii) පවසයි/ උදා/ වස්තුහාමි/ වන/ බව/ කාලයක්/ අයහපත්/ ඉදිරියේ දී

..........................................................................................

(iv) උදුරා/ අතෙහි/ මා/ ඇති/ සීනි බෝලය/ වරෙක/ ඈ/ ගත්තාය

..........................................................................................

(v) ඉපිල/ දිවා/ පසු/ ආහාරයෙන්/ පිරිස/ යන/ ඇසූ/ බව/ මඩොල්දූව/ ළමා/ ගියහ/ සතුටින්

..........................................................................................

..........................................................................................





(15) **පහත ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

චූටි කුරුල්ලනි චූටි බටිත්තනි - පියාසලා අහසේ
රංචු ගැසී පියඹන්න ඉතින් ඔබ - ලස්සන ආකාසේ

කන්ද උඩින් අර ලස්සන හිරු නැග - ලොව ම එළිය කරනා
කුරුලු හඬින් මුළු ලොව ම අවදි කර - දවස උදා වෙනවා

කීචි බීචි ගා චූටි කුරුල්ලෝ - චූටි ගීත ගයතෙයි
ගීත ගයා ඒ චූටි කුරුල්ලෝ - වන්නමකුත් නටතෙයි

ගීත ගයාලා වන්නම් නටලා - ලොව ම අවදි කරතෙයි
චූටි බබාලා ඒව බලාලා - සතුටු සිතින් නැළවෙයි

(i) අහසේ පියාසලන්නේ කවුරුන් ද? ..............................................................

(ii) දවස උදා වූ බව කියවෙන ගීත කොටස කුමක් ද? ......................................

(iii) චූටි කුරුල්ලන් ගීත ගැයීමෙන් පසුව කරන්නේ කුමක් ද? ..............................

(iv) සතුටු සිතින් නැළවෙන්නේ කවුරුන් ද? ......................................................

(16) **පහත ඡේදයේ ඇති උපමා තෝරා ලියන්න.**

**මඩොල් දූව මාර්ටින් වික්‍රමසිංහ**

ගසක කොළයක් පවා සොලවන තරම් සුළඟ කුඩු නොහැමූ නිසා නිසන්සල වූ දිය ඇති නදිය, නිල් මිණි තලාවක් සේ බබළයි. නදියෙහි ඈත තැනින් තැන වූ ගල්කුළු අසල නවත්වන ලද ඔරුත් එහි හිඳගෙන මාළු බාන මිනිසුනුත් අපට පෙනුණේ කළු පාට සෙවණැලි ලෙසිනි. ළහිරු රැසින් බැබළෙන දිය ඇති නදියෙහි ඇතැම් තැනක් රිදී කඳක් සේ සිත් ගනියි. අතුරන ලද මාගල් පැදුරක් සේ දියකඳ වසා සිටි පෙඳ ඇතිරිල්ල උඩින් ඔරුව පැදවීම අමාරු කාරියක් විය. හබලෙහි ඇවිලීමෙන් හබලත් සමඟ දියෙන් ඉස්සෙන පෙඳ කැටිවලින් පනින කූනිස්සෝ, පොරි ඉසින්නක් මෙන් යළිත් දියෙහි වැටෙති.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

(iii) ..............................................................................................

(iv) ..............................................................................................

(v) ..............................................................................................

(17) **කොටුව තුළ ඇති වචනවලින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරා ලියන්න.**

| | | | |
|---|---|---|---|
| වෛද්‍යවරු | ගංගා | ඖෂධීය | තාරාවියක් |
| රූපය | නිළියක | ඔවුන් | ඓක්‍යය |

(i) මහාප්‍රාණ අක්ෂරයක් ඇති වචනයකි. - ..........................................

(ii) පිලි නොමැති වචනයකි. - ..........................................

(iii) දික් ඇදපිල්ල යෙදුණු වචනයකි. - ..........................................

(iv) ස්ත්‍රී ලිංග ඒකවචන අනුක්ත නාම පදයකි. - ..........................................

(18) **ගැළපෙන පරිදි 'ඈ/ ඇය, ඔහු, ඌ' යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(i) වෙද මහතා ඖෂධ පැළෑටි සෙවීමට කැලයට යයි.
.......................... දුර්ලභ ගණයේ ඖෂධ පැළෑටි සොයා ගනියි.

(ii) මොනරා පිල් විදහා නැටුමක් නටයි.
.................... ආඩම්බරයෙන් වටපිට බලයි.

(iii) ඉංජිනේරුවරයා නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා පිටත් වෙයි.
..................... ඒ සඳහා උපදෙස් සපයයි.

(iv) ගුරුතුමිය සෑම විට ම සිනා මුසු මුහුණින් සිටියි.
................. ප්‍රිය වචනයෙන් කතා කරයි.

(v) වෙළෙඳ ව්‍යාපාරිකයා උගත්, බුද්ධිමත් අයෙකි.
................ තම ව්‍යාපාරය සාධාරණ ව පවත්වා ගෙන යයි.

(19) **නිවැරදිව ගළපන්න.**

තෙල් හිඳින උපකරණයකි.
සීසෑමට භාවිතා කරයි.
ධාන්‍ය මනින උපකරණයකි.
ගමනාගමනය සඳහා භාවිත කර ඇත.

| |
|---|
| නගුල |
| තිරික්කලය |
| සෙක්කුව |
| සේරුව |






(20) **පහත වචන යොදා අර්ථවත් වැකි ගොඩනගන්න.**

(i) දෛනික - ....................................................................................

(ii) ඖෂධ - ....................................................................................

(iii) ස්වේච්ඡාවෙන් - ....................................................................................

(iv) මහපටැඟිල්ල - ....................................................................................

(v) සියැටල් - ....................................................................................

---

**විශේෂ සටහන්**

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

# විස්සයි විස්සේ වැඩමුළු මාලාව - 2023

**සැප්තැම්බර් 09 සිට සෑම සෙනසුරාදා දිනක ම සවස 6.00 - රාත්‍රී 9.00 දක්වා**

- අවසාන ගණිත ගැටලු වැඩමුළුව ⟶ සැප්. 09 සෙනසුරාදා සවස 6.00 ට
- අවසාන සිංහල වැඩමුළුව ⟶ සැප්. 16 සෙනසුරාදා සවස 6.00 ට
- අවසාන පරිසරය වැඩමුළුව ⟶ සැප්. 23 සෙනසුරාදා සවස 6.00 ට
- අවසාන විභව්‍යතාමාන ⟶ සැප්. 30 සෙනසුරාදා සවස 6.00 ට

**සැප්තැම්බර් 09 සෙනසුරාදා දහවල් 12.00 ට පෙර ලියාපදිංචි වන්න.**

♦ 3 , 4 ශ්‍රේණිවල මඟ හැරුණු විෂය කොටස් නැවත මතක් කෙරේ.

♦ 2023 විභාග අනුමාන සුවිශේෂී ප්‍රශ්න රැසක් සාකච්ඡා කෙරේ.

## මොහාන් සර්

SARASAVI ONLINE SCHOOL

077 - 42 55 968 / 070 - 71 800 08


**2020 ශිෂ්‍යත්ව විභාගයෙන් ලංකාවෙන් ම දෙවැනියා සහ වයඹ පළාතේ ප්‍රථමයා වූ දරුවාගේ අදහස් .............**



2020.11.18,

නො. 162 මැදගම පාර,
කුරුඳුවත්ත මාදම්පේ

බුදු සරණයි!

මා දයාබර මොහාන් සර් වෙත,

මම ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 199 ලබාගෙන ලංකාවෙන් දෙවෙනි ස්ථානයටත් වයඹ පළාතෙහි ප්‍රථම ස්ථානයටත් පත් වීමට හැකි විය. ඒ සඳහා ඔබ මට ඉගැන් වූ විෂය කරුණු සහ කෙටි ක්‍රම මට බෙහෙවින් උපකාර විය. ඔබට තෙරුවන් සරණයි!

මීට ඔබගේ
ශිෂ්‍යාව
ඉවානා නිසලි

# 5 ශිෂ්‍යත්ව විභාගය - 2023 (ඔක්තෝබර්)

## විභාගයට අත්‍යවශ්‍ය විෂය කොටස් ආවරණය කෙරෙන

**පාන්දර පන්තිය - සෑම දිනක ම පාන්දර 5.00 - 6.00 දක්වා**

## 2023 අනුමාන,කලාප,පළාත් ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කරන

**ප්‍රශ්න පත්‍ර පන්තිය - සෑම සඳුදා / බදාදා / සිකුරාදා දිනකම රාත්‍රී 7.00 - 8.30 දක්වා**

## විස්සයි විස්සේ වැඩමුළු මාලාව - 2023

**සැප්. 09 සිට සෑම සෙනසුරාදාවක ම සවස 6.00 - රාත්‍රී 9.00 දක්වා**

**පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර පන්තිය - සෑම ඉරිදාවක ම රාත්‍රී 7.00 - 8.30 දක්වා**

- ඉහත සියලු පන්ති සඳහා මාසික අය කිරීම රු. 2200/= ක් පමණි.
- අද මුදල් ගෙවා අද සිට ම ඔබේ දරුවාට පන්තියට සහභාගි විය හැක.

## සැප්තැම්බර් මාසය සඳහා නවක දරුවන් දැන් බඳවා ගැනේ.

### පන්ති ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය

| | |
|---|---|
| මහජන බැංකුව (හලාවත ශාඛාව)<br>Ac. No : 024-2-001-6-0068967<br>P.K. Nillushini Perera | ලංකා බැංකුව (හලාවත ශාඛාව)<br>Ac. No : 87599195<br>P.K. Nillushini Perera |
| සම්පත් බැංකුව (හලාවත ශාඛාව)<br>Ac. No : 110852271840<br>P.K. Nillushini Perera | කොමර්ෂල් බැංකුව (හලාවත ශාඛාව)<br>Ac. No : 8011500960<br>P.K. Nillushini Perera |

ඉහත බැංකුවලින් පහසු බැංකුවකට අදාළ පන්ති ගාස්තුව ගෙවා රිසිට්පත 077 - 42 55 968 යන අංකයට වට්ස් ඇප් පණිවිඩයක් යොමු කරන්න.

**2020 ශිෂ්‍යත්වයෙන් ලංකාවෙන් ම දෙවැනියා සහ 2021 ශිෂ්‍යත්වයෙන් සහ 2022 ශිෂ්‍යත්වයෙන් වැඩි ම සමත් ප්‍රතිශතයක් වාර්තා කළ ප්‍රවීණ ගුරුතුමා**

# මොහාන් සර්

SARASAVI ONLINE SCHOOL

077 - 42 55 968 / 070 - 71 800 08